# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 669/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 18/04/2024 පැය 2010

**මාධ්‍ය නිවේදනය**

**විදේශ ජාතිකයෙකුගෙන් මුදල් වංචා කිරීම සම්බන්ධව සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගල්ල සංචාරක පොලිස් ස්ථානය.**

කළුතර දකුණ පොලිස් වසමේදී ආහාර වෙළඳ සැලකින් ආහාර ලබා ගත් විදේශ ජාතිකයෙකුගෙන් වැඩිපුර මුදල් ලබා ගැනීමක් සම්බන්ධව 2024.04.17 වන අද දින විද්‍යුත් පණිවිඩයක් මඟින් මොරගල්ල සංචාරක පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ලැබී ඇත.

මෙම සිදුවීම 2024.02.09 වන දින සිදුව ඇති අතර, මීට අදාල සැකකරු සංචාරක මගපෙන්වන්නෙකු ලෙස හැසිරෙමින් බෙල්ජියම් ජාතිකයෙකු විසින් ලබාගත් උළුදු වඩයක් සහ තේ පානයක් වෙනුවෙන් වංචනිකව රුපියල් 800/- ක මුදලක් ලබාගෙන නියමිත මුදල පමණක් වෙළඳසැල් හිමිකරුට ලබාදී ඉතිරි මුදල් ඔහු සතුව තබාගෙන ඇති බවට අනාවරණය වී ඇත.

මීට අදාල වීඩියෝවක් රූපවාහිනී ප්‍රවෘත්ති විකාශයන්හි ප්‍රචාරය වූ අතර සමාජ මාධ්‍ය ජාලා වලද සංසරණය වන ලදී. 2024.04.17 වන අද දින දහවල් කාලයේ මෙම සිදුවීමට අදාල සැකකරු කළුතර දකුණ පොලිස් ස්ථානයේදී මොරගල්ල සංචාරක පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන කළුතර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වූ පලාතොට, කළුතර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු වෙළඳසැල අවට සිටින පුද්ගලයෙකු බවත් අදාල වෙළඳසැලට පැමිණෙන විදේශිකයන් රවටා මුදල් ලබා ගැනීම සිදු කරන බවටත් සිදු කල විමර්ශන වලදී අනාවරණය වී ඇත. සැකකරු 2024.04.19 වන දින කළුතර ගරු මහේස්ත්‍රාත්

අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. මොරගල්ල සංචාරක පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**